# Information for Social Development

## Abstracts

### 3rd LIS Research Symposium 2012



Library and Information Science Alumni Association,
Department of Library and Information Science,
University of Kelaniya,
Sri Lanka.

12th May 2012

# ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාල ස්වයංක්‍රියකරණ මෘදුකාංග භාවිතය පිළිබඳ අධ්‍යයනයක්

**ජී. එම්. සමන් කුමාර**
gmskkumara@gmail.com

සාරාංශය

තොරතුරු රැස් කිරීම, සංරක්ෂණය හා බෙදා හැරීම යනාදී පුස්තකාල කාර්යයන් සඳහා පරිගණකය, ස්වයංක්‍රියකරණ මෘදුකාංග භාවිතය පුස්තකාලයන්ට අත්‍යාවශ්‍ය සාධකයක් බවට පත්ව තිබේ. මෙතුළින් නව මුහුණුවරක් පුස්තකාලයට ලබා ගැනීමට හැකි වී ඇති අතර එමඟින් පාඨකයාට කාර්යක්ෂම හා වඩාත් සඵලදායී පුස්තකාල සේවාවක් ලබා ගැනීමට ද හැකි වී තිබේ.

මෙසේ පුස්තකාල ස්වයංක්‍රියකරණය සඳහා බිහි වූ විවිධ මෘදුකාංගයන් උපයෝගී කර ගෙන " ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාල ස්වයංක්‍රියකරණ මෘදුකාංග භාවිතය පිළිබඳ අධ්‍යයනයක්" යන මෙම අධ්‍යයනය සිදු කිරීම තුළින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාලවල ස්වයංක්‍රියකරණය කර ඇති ක්ෂේත්‍ර හඳුනා ගැනීම, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාලවල භාවිත ස්වයංක්‍රියකරණ මෘදුකාංග මොනවාදැයි යන්න පිළිබඳ අධ්‍යයනය කිරීම, එකී මෘදුකාංග භාවිතයෙහි ගැටළු හඳුනා ගැනීම, ඉහත හඳුනාගත් ගැටලු අවම කර ගැනීම සඳහා යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීම, යනාදිය මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණු විය.

මේ සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන විශ්වවිද්‍යාල පුස්තකාල 8 ක් නියැදිය ලෙසින් තෝරා ගන්නා ලදී. දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය ලෙස සමීක්ෂණ ක්‍රමවේදය උපයෝගී කර ගන්නා ලදී. ද්විතීයික දත්ත රැස් කිරීම සඳහා දේශීය හා විදේශීය වශයෙන් ඇති මූලාශ්‍ර ගවේෂණය කිරීම සිදු කරන ලදී. මෙසේ රැස් කර ගත් දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ශිල්ප ක්‍රම භාවිතයෙන් එනම්, වගු ප්‍රස්ථාර සටහන් සහ ප්‍රතිශත භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදී. විශ්ලේෂණය කරගත් තොරතුරුවලට අනුව අධ්‍යයන ගැටළුවට සමගාමීව ප්‍රධාන වශයෙන් පාඨකයන්ට කාර්යක්ෂම සේවාවත් සැපයීම මූලික කර ගෙන කාර්යය මණ්ඩලයේ ද කටයුතු පහසුවෙන් සිදු කර ගැනීමටත් විශ්වවිද්‍යාල පුස්තකාල ස්වයංක්‍රීයකරණය සඳහා යොමු වී තිබේ. එමෙන්ම ස්වයංක්‍රීයකරණය සඳහා වැඩි වශයෙන් විශ්වවිද්‍යාල පුස්තකාල. භාවිත කරනු ලබන්නේ වාණිජ මෘදුකාංග වන අතර වාණිජ මෘදුකාංගයන්හි ඇති මිල අධිකකම නිසා විවෘත මූලාශ්‍ර මෘදුකාංග වෙත යොමු වීමේ පුස්තකාල ප්‍රමාණය වර්ධනය වෙමින් තිබෙන බව නිගමනය විය.,

වර්තමාන යුගය වන විට බොහෝ පුස්තකාලයන් ස්වයංක්‍රීයකරණය වී ඇති බවක් දක්නට ඇති අතර එහි දී ඒවා මුහුණ පා ඇති ගැටලු බොහෝ ය. එකී ගැටළු අවම කර ගැනීම මෙන් ම ඉදිරියේ දී ඇති විය හැකි ගැටලු මැඩ පවත්වා ගැනීමට අවශ්‍ය පරිසරය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමට ද විශේෂයෙන් මෙම අධ්‍යයනය මඟින් වර්තමාන විශ්වවිද්‍යාල පුස්තකාලවල භාවිත මෘදුකාංග පිළිබඳව දැන ගැනීමට හැකි වන්නාසේ ම විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ට වැදගත් වන විවිධ පරිපාලනමය තීරණ ගැනීමට ද හැකිවනු ඇත.

*Keywords: Library Automation, Library automation software, University Libraries, Sri Lanka*